

# හිම බිමේ සුදු රෝස

7

පර්ත් හි
**විද්‍යානි මනතුංග ලියන**
නව කතාව

**මෙතෙක් කතාව**

ආදරයක අසංවේදී අතීතය මත සිත්තම් වෙමින් පැවතියේ ප්‍රමාදයක හෙලිදරව්ව බව නොදැන නමුත් ලහිරු නැවත වරක් පර්ත් පැමිණෙන්නේ එහි චමත්කාරය පමණක් ම ප්‍රාර්ථනා කරමින් ටාන්‍යා හමුවීම වෙනුවෙනි. උපාධි ප්‍රධානෝත්සවය දා රාත්‍රියේ ඔහුට හෙලිදරව් වන්නේ බලාපොරොත්තු නොවූ ඒ අම්හිරි සත්‍යයයි. ටාන්‍යා වෙනුවෙන් පොදි බැඳගත් ආදරය හිරුඑළිය දැකීමටත් පෙරම මිලිනවූ කුසුමක් පරිද්දෙන් හදවතේ ගැඹුරු මතකයට පමණක් සිරකරගන්නා ලහිරු යතාර්ථයට කෙසේ මුහුණදීමට උත්සාහ දරණු ඇත්ද.......?

මම කුලී රථයකින් පීටර් අන්කල්ලෑ ගෙදරට යනවිටත් ඔවුන් සියල්ලෝම මා වෙනුවෙන් අවදිව සිටියහ. මහන්සි වැඩි යැයි කියමින් මම කෙලින්ම කාමරයට ගියෙමි. ඇඳට වැටුණු මා බොහෝ වේලාවක් නිදි වර්ජිතව කල්පනාවේ යෙදුනෙමි. මේ මුහුණ මට අමතක කළ නොහැක. ''ටාන්‍යා.... ඔබ පිළිනොගත්ත ද... මා තුළ ඔබ කෙරෙහි වන ආදරයෙන් මිදීමට මම අපොහොසත් වෙමි....... තරුණ වියේ බොළඳ සිතිවිලිවලින් පිටස්තර වුණු ආදරයේ ගැඹුරු අරුත මා වටහාගන්නා ලද්දේ ඔබෙනි.... දුටු පමණින් සිත් ඇඳගන්නා සුලු නොවන ගැහැණියකගේ කිසිදු වටිනාකමක් නැත යැයි සිතා මුලාවේ වැටී තිබූ මා හදවතට යුවතියකගේ පිරිසිදු හදවතක ඇති සැබෑ වටිනාකම පෙන්වා දෙන ලද්දේ ඔබ විසිනි.... එසේ වූ බැවින්ම මගේ අනාගත ඉරණම කුමක් වුවද ඔබේ සතුටත් සැපතත් මල්ඵල ගන්වා ගැනීම වෙනුවෙන් මට හැකි සෑම ආකාරයකම කැපකිරීමක් මම ඔබ වෙනුවෙන් කරන්නෙමි......'' යැයි සිතා සිත සැහැල්ලු කරගැනීමට මම උත්සාහ ගතිමි. කොයි වෙලාවේ නින්දට වැටුනාදැයි මට හැඟීමක් නොවුනි....

පසුදා මා බලාපොරොත්තු වූ පරිදිම මහේලත් ටාන්‍යාත් අප සමග රාත්‍රී ආහාර ගැනීමට පැමිණියේ නැත. එය ටාන්‍යාගේ නොව මහේලගේ උවමනාවට සිදුවූ දෙයක් බව මම දන්නෙමි. ඊට පසුදා සවස අම්මලා සමඟම පිටත්ව යන්නට මම ගුවන් ටිකට් පත පිළියෙල කර ගත්තෙමි. ඒ පිළිබඳව ඔවුන් මහත්සේ සතුටක් දැක්වූහ. ලංකාවට ගිය පසු ඔවුන් සතුටු වන ආකාරයේ යමකින් මගේ ජීවිතය අලුතින් පටන්ගන්නෙමි යැයි මම සිතා සිටියෙමි. මා පර්ත් සිටි ඒ අන්තිම දවසේ උදෑසන එක් අවස්ථාවක දුරකථනයට පිළිතුරු දුන් ජානකී කෙලින්ම පැමිණියේ මා වෙතටය.

''ලහිරු අයිය ඔයාටයි කෝල් එක...''
''මට.... කාගෙන්ද...?''
''ටාන්‍යාගෙන්......''
මට එක්වරම කිසිවක් සිතාගත නොහැකි විය. එහෙත් සිහි එළවාගත් මම ජානකීට පිළිතුරු දුනිමි.

''අනේ ජානකී... කියන්න මම නැහැ කියල... මට බැහැ දැන් එයාට කතා කරන්න....''
''පුළුවන් නම් එයාට කතා කරන්න ලහිරු අයිය. ඔයා අද යන බව එයා දන්නව....''

එහෙත් මා තුළ ඈ සමග කතා කිරීමට වචන ගොනුකර ගැනීමට තරම් ආත්ම ශක්තියක් නොමැත. නොඑසේ නම් මේ ඊට අවස්ථාව නොවන බව සිත කියයි. මම අද සදහටම ඇගෙන් ඈත්ව යන්නෙමි. මේ කතාබහ නිසා මගේ හදවත පෑරීමට හොඳටම ඉඩ ඇත. නිශ්චල සිතිවිලි තුළ මා හදවතේ ගිලී සිටින ඈ වෙනසක් නොවී ඒ ආකාරයෙන්ම රැගෙන යාම වඩාත්ම හොඳ යැයි මම තීරණය කෙරුවෙමි.

''ජානකී... මට කරන උදව්වක් හැටියට ඔයාම එයාට කතාකරන්න.... මීට වඩා මට කරදර කරන්න එපා මේ ගැන.... ප්ලීස්''
ඈ ඉවත්ව ගියේ මා වටහාගත්තාක් මෙනි. ඈ කතා කර දුරකථනය තියනවාත් සමඟ ග්‍රේස් ඇන්ටි ජානකීට කතා කරනවා මට ඇසිනි.

''කවුද ජානකී''
''මේ මගෙ යාලුවෙක් අම්ම''

............

මා ආපසු ලංකාවට පැමිණ මේ වන විට මාස ගණනාවක් ගතවී ගොස් තිබිණි. මම මුලින් ම කළේ මට සුදුසු වෙතැයි හැඟී ගිය සෑම රැකියාවක් වෙනුවෙන්ම



ඉල්ලුම්පතක් දැමීමය. වැඩි උත්සාහයකින් තොරව මට රැකියාවක් ලබාගැනීමට හැකි විය. රටේ බොහොමයක් පිහිටුවාගෙන තිබෙන විදේශීය වෙළෙඳ සමාගම් අප වැනි විදේශීය අධ්‍යාපනය ලද කෙනෙකුට රැකියාව ලබාදීමට ඉතා කැමැත්තෙන් සිටින බව සහභාගි වුණු සෑම සම්මුඛ පරීක්ෂණයක දී ම පෙනී ගිය කරුණකි. මට වඩා දක්ෂ, හැකියාවන් අතින් පිරීගිය බැවින් ම විදේශගත නොවී ලංකාවේ විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබා සිටි බොහෝ තරුණයන්ට සිදුවූයේ හිස් අතින් ම ආපසු හැරී යාමටය.

රැකියාව නිසා ම මම නැවතවරක් කොළඹ පදිංචියට පැමිණියෙමි. මට උවමනා වූයේ හුදකලාවේ ම තැනක නැවතීමට වුවද දෙමාපිය බලකිරීම මත මම ආච්චිලෑ ගෙදර නැවතීමට ගියෙමි. හැමදාම ගෙදර යාමට පෙර ගාලු මුවදොරට වී මොහොතක් හෝ තනිවී සිටීමට මම උත්සාහ කළෙමි. මා එතනට වී ටාන්‍යා ගැන ම සිත සිතා සිටියේ නැත.

ඇගේ මතකය මා හදවතේ නිදන්ගත වී තිබෙන්නක් බව නොරහසකි. නමුත් මා සිතට සතුටක් රැගෙන එන ඒ දර්ශනය තුළ සිට මෙතෙක් මා දැක නොතිබුණු තේරුම් ගෙන නොතිබුණු අනික් බොහෝ ජීවිත දෙස ගැඹුරින් බැලීමට මම උත්සාහ ගතිමි. මා අවට දුටු බොහෝ ජීවිත ප්‍රශ්නවලින් ම පිරී ගිය ඒවාය. ඒ අතින් මා සිටයේ සතුටටත්, සෑහීමකටත් පත්විය හැකි වූ ජීවන මට්ටමක බව වටහා ගැනීමට තරම් ගැඹුරුවූ ජීවන දැක්මක් මම ඒ වනවිට හිමිකරගෙන සිටියෙමි.

මගේ රැකියා ආයතනයට අයත්ව වෙනත් ඈත ස්ථානයන්හි පිහිටුවා තිබූ අංශවලට අදාළ කටයුතු සඳහා වරින්වර මට කෙළඹින් පිටව යාමට සිදුවිය. ඔවුන් මට ඒ සඳහා වාහනයක් ලබා දුන්න ද මටමයි කියා වාහනයක් ගැනීමට සූදානම් උනෙමි. ඒ බව ඇසූ තාත්තා ඔහුගේ මැදිහත්වීමෙන් මට වාහනයක් රැගෙන දුන්නේ ය. එය මගේ සතුටට හේතු නොවීය. මම මගේ අසතුට ගෙදර ගිය දිනක අම්මාට හෙළි කළෙමි.

-ඇයි අම්ම... තාත්ත මට තනියෙන් මගේ වැඩක් කරගන්න ඉඩ දෙන්නෙ නැත්තෙ....?''

-පුතා මොකක් ගැන ද මේ කියන්නෙ?"
-මම කියන්නෙ කාරෙක ගැන... තාත්තා ඒක මට කරගන්න ඉඩ දුන්නානම් ඉවරයිනෙ."

-එහෙම හිතන්න එපා පුතා. තාත්ත, කොච්චර ආසාවකින් ද ඒ වැඩේ කළේ ඔයා වෙනුවෙන්."
-ඒ වුණාට මම කැමැතියි මගේ වැඩක් තනියෙන් ම කරගන්න ඉඩදෙනවා නම් දැන්වත් තාත්ත.... මම තාම පොඩි ළමයෙක් කියලනෙ තාත්ත හිතා ඉන්නෙ."

-නෑ පුතා අපි දෙන්නම එහෙම හිතන්නෙ නැහැ... ඔයා දන්නව ද.... තාත්ත හරිම සතුටු වෙනව ඔයා ගැන දැන්... ඔයා වෙනුවෙන් තව එක යුතුකමක් අපිට කරන්න තියෙනව.... ඊට පස්සෙ ඔයාගෙ ජීවිතේ සම්පූර්ණයෙන් ම ඔයාට බාරයි."
-ඒ මොකද්ද......?"
-ඔයාට සුදුසු කෙනෙක් එක්ක ඔයා දැන් විවාහ වෙන්න ඕනැ... ඔයා අපිට ඉඩ දෙනවා නම්.. එහෙම දෙයක් ගැන හොයලා බලන්න පුළුවන් තාත්තටයි මටයි..."

-කරුණාකරල, ඒ ගැන නම් මට කතාකරන්න එන්න එපා අම්ම..." මම හුන් තැනින් නැගී සිටිමින් පැවසුවෙමි. එය මා ගෙදර එන ගමනත් අඩු කිරීමට හේතුවන කරුණකි.
-ලහිරු, ඔහොම ඉන්න. දැන් කතා නොකර වෙන කවදද කතා කරන්න කියල කියන්නෙ ඔයා...?" මම නැවතුනෙමි.
-අම්ම. මට එහෙම දෙයක් ඕනැයි කියල හිතුණු දවසට මම අම්මට ඒ ගැන කියන්නම්.... එතකන් මට ඔය ගැන විතරක් කතා කරන්න එපා." ඈ කිසිවක් නොකියා නිහඬ විය. අම්මා මා පිළිබඳව යමක් තේරුම් ගත්තා දැයි මම නොදනිමි.

මගේ හදවත නැවතිනි. මේ කටහඬ.... මේ ඇත්තක් ද...? දුරකථනය ඔස්සේ ගලා ආ ඒ කටහඬ ඇගේ ද..?



විශේෂ සිදුවීමකින් තොරව කාලය දෙසැම්බර් දක්වා ගලා ගියේය. අම්මා ඉන්පසු මට විවාහයක් ගැන කරදර කළේ නැත. පසුගිය දෙසැම්බරය දක්වා කාලය දෙස හැරී බලන විට මා තුළ සිදුවී තිබෙන වෙනස්කම් ගැන මම පුදුමයට පත් වෙමි. මා ඇත්ත ඇතිසැටියෙන් දකින්නේ දැයි යැයි සිත කියයි. විනෝදයත්, සැහැල්ලුවත් යන දෙකට ම වඩා අර්ථවත් වූ යමක් යුවතියකගේ ඇසුරින් තරුණයකුට ලද හැකි බව මම දැන් පිළිගනිමි. නමුත් ඒ ගැඹුරින් අර්ථවත් වූ සතුටත්, සුන්දරත්වයත් ඇත්තේ බැලූ බැල්මට ම ලස්සන යැයි පෙනී යන ඇගේ මුහුණේ නොව ඇගේ දෙනෙත් ඔස්සේ කිදාබැසිය හැකි හදවතේ යැයි මට මම සිතමි. එහෙත්... එසේ ගැඹුරින් හදවතේ ලස්සන දැකිය හැකි වන්නේ එකම එක යුවතියක් තුළ... එකම එක වතාවක දී පමණක් නොවේ ද....?

එදා ඒ දුරකථන ඇමතුම ලැබෙන විට මා සිටියේ රැකියාවට අදාළ කරුණක් වෙනුවෙන් නුවර ගොස් ය. දවල් කෑම වේලාවට හොඳට ම ආසන්නය. නමුත් කළ යුතු වැඩ කිහිපයක්ම තව ඉතිරිව තිබුණොත් ඒ ටිකත් ඉවරකර කෑම ගන්නවා යැයි මම සිතාසිටියෙමි. ඒ අතර මා අත වූ ජංගම දුරකථනය නාද විය. කලබලයේම මම ඊට පිළිතුරු දුන්නෙමි.

-හලෝ..."
-හලෝ..."

මගේ හදවත නැවතිනි. මේ කටහඬ.... මේ ඇත්තක් ද...? දුරකථනය ඔස්සේ ගලා ආ ඒ කටහඬ ඇගේ ද..? කතාකිරීමට කිසිවක්ම සිතාගත නොහැකිව මම මොහොතකට ගොළු උණෙමි.....

**මතු සම්බන්ධයි**

